**බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**
**2021 වසර සඳහා**
**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම.**

බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය හා බස්නාහිර පළාත තුල පිහිටි ප්‍රාදේශිය කාර්යාල 07 ක් ඇතුළු බස්රථ නැවතුම්පලවල් සඳහා 2021 වසරට භාණ්ඩ හා සේවා සැපයිම් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය පිණිස රජයේ සහ පිළිගත් සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**භාණ්ඩ -**

01. සියළුම ලිපි ද්‍රව්‍ය
02. කාර්යාල ලීබඩු හා උපකරණ
03. කාර්යාල උපකරණ
04. විදුලි පංකා / විදුලි උපකරණ
05. **රථවාහන/යතුරු පැදි**
    - 5.1 ටයර් සහ ටියුබ්
    - 5.2 බැටරි
06. **පරිගණක හා උපාංග**
    - 6.1 පරිගණක යන්ත්‍ර හා උපාංග
    - 6.2 පරිගණක මුද්‍රණ යන්ත්‍ර
    - 6.3 Fax යන්ත්‍ර
    - 6.4 ගණක යන්ත්‍ර (CACULATOR)
    - 6.5 ඡායාපිටපත් යන්ත්‍ර/ස්කෑන් යන්ත්‍ර
07. ගොඩනැගිලි ඉදිකිරිම ද්‍රව්‍ය (යකඩකූරු කම්බි හා තීන්ත වර්ග ඇතුළුව)
08. **නිල ඇඳුම්**
    - 8.1 නිල ඇඳුම් සඳහා රෙදි සැපයීම
    - 8.2 නිල ඇඳුම් සඳහා සපත්තු, මේස් ආදිය සැපයීම
    - 8.3 නිල ඇඳුම් මැසීම
09. වඩු කාර්මික කටයුතු සම්බන්ධ සේවා සැපයීම
10. ගෘහ අලංකරණ උපකරණ, තිරරෙදි සැපයීම
11. රබර් මුද්‍රා, දින මුද්‍රා ආදිය සැකසීම / යතුරු කැපීම
12. ඇමතුම් උපකරණ/ඇම්ප්ලිපයර්/ස්පිකර්
13. CCTV කැමරා / ඩිජිටල් කැමරා සහ මල්ටිමීඩියා උපකරණ
14. විදුලි උපාංග හා අමතර කොටස්
15. ත්‍රිවිල් ගාස්තු මීටර්
16. බස්රථ කාලසටහන් යන්ත්‍ර(POS)
17. ඩිජිටල් නාම පුවරු සැලසුම් කිරිම භාසකස් කර ස්ථාපිත කිරිම
18. ඇඟිලි සළකුණු යන්ත්‍ර
19. **සනීපාරක්ෂක ද්‍රවය සැපයීම**
    - 19.1 සනීපාරක්ෂක අත්සේදුම්කාරක ද්‍රව්‍ය

19.2 ශරීර උෂ්නත්වමාපක
19.3 සනීපාරක්ෂක ඇඳුම්
19.4 ග්ලවුස්, මුඛ ආවරණ (Face Mask )

20. සූර්ය විදුලි බල පද්ධති
21. **මුද්‍රණය සහ ඕෆ්සෙට් කිරීම**
    21.1 දැඩි බැඳීම් සහිත පොත් මුද්‍රණය,
    21.2 ව්‍යාපාර කාඩ්පත්, හැඳුනුම්පත්
    21.3 පසුබිම්, නාම පුවරු, බැනර්
22. ඡායාරූපකරණය,මුද්‍රණය / රාමු කිරීම සහ වීඩියෝකරණය ආශ්‍රිත සේවා
23. නිර්මාණකරුවන්
    23.1 අභ්‍යන්තර නිර්මාණකරුවන් ( Interior Designers)
    23.2 බාහිර නිර්මාණකරුවන් ( Exterior Designers) (උද්‍යාන අලංකරණ සේවා ආදිය)
24. කෘමීන් හා පළිබෝධ පාලන සේවා
25. මගී ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය සඳහා වාහන කුලියට ගැනීම සහ කුරියර් (Courier) සේවා සැපයීම

## ඉදිකිරීම් -

01. වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්(ඉක්ටැඩ්ලියාපදිංචිය සහිත) (බස්රථ නැවතුම්පල හා කාර්යාල ඉදිකිරීම් වැඩ)
02. සුළු වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් (ඉක්ටැඩ්ලියාපදිංචිය රහිත)
    (මගී ආවරණ / නැවතුම් සංඥා පුවරු ඉදිකිරීම හා ස්ථාපිත කිරීම්, ගොඩනැගිලි කඩා ඉවත් කිරීම් සහ වෙනත් සුළු කොන්ත්‍රාත් වැඩ)

## සේවා -

01. **සියලුම මුද්‍රණ කටයුතු හා පොත් බැඳීම්**
    1.1 ලිපිද්‍රව්‍ය හා අනෙකුත් ලේඛණ මුද්‍රණ කටයුතු
    1.2 ස්ටිකර් මුද්‍රණ කටයුතු (ඩිජිටල් හා ස්ක්‍රීන්)
    1.3 PVCහැඳුනුම්පත් මුද්‍රණය
    1.4 සියලුම පොත් බැඳීම් කටයුතු
02. **රථ වාහන අළුත්වැඩියාව**
    2.1 වාහන සේවා කිරීම ,
    2.2 කුෂන් වැඩ සහ කාපට්
    2.3 ටින්කර් කිරීම, පින්තාරු කිරීම, එන්ජින් අළුත්වැඩියා කිරීම
    2.4 Wheel Alignment සේවය,
    2.5 විදුලි පද්ධති අළුත්වැඩියාව
    2.6 වායු සමීකරණ පද්ධති අළුත්වැඩියාව
03. යතුරුපැදි අළුත්වැඩියා හා සේවා කිරීම

04. **කාර්යාල උපකරණ අලුත්වැඩියා හා සේවා**
    4.1 ගණක යන්ත්‍ර (Calculator)
    4.2 පරිලෝකන යන්ත්‍ර (Scanner)
    4.3 ඩිජිටල් කැමරා (Digital camera)

4.4 Fax යන්ත්‍ර අළුත්වැඩියා
4.5 ඡායාපිටපත් යන්ත්‍රඅළුත්වැඩියා

05. **පරිගණක උපකරණ අලුත්වැඩියා හා සේවා**

5.1 පරිගණක යන්ත්‍ර හා උපාංග අළුත්වැඩියා
5.2 පරිගණක මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා
5.3 ජාලාකරණ උපාංග
5.4 පරිගණක හා සර්වර් (Computer Servers) පද්ධති අලුත්වැඩියා හා සේවා

06. **පරිගණක මෘදුකාංග සහ දෘඩාංග**

6.1 Computer Software
6.2 Enterprise Grade Application Software
6.3 Website Development and Related Software
6.4 Software Licenses (Operating System Virus Guard, MS Office etc)
6.5 Network Security Equipment and Software (Firewall, Load Balancer etc)
6.6 Mobile Development and Related Software
6.7 Any Other Software (Computer Hardware ,Server Hardware , Server Related Software )

07. කාර්යාල ලී බඩු උපකරණ අළුත්වැඩියා හා නඩත්තු
08. දුරකථන අළුත් වැඩියා හා සේවා
09. විදුලි කාර්මික කටයුතු හා ඇදිම්
10. කාර්යාල වායු සමීකරණ නඩත්තු හා සේවා
11. ජෙනරේටර් අළුත්වැඩියා හා සේවා
12. ජලනල පද්ධති නඩත්තු
13. ගොඩනැගිලි ඉදි කිරිමට අදාල ගෘහනිර්මාණ සැලසුම් සකස් කිරිම
14. කාර්යාල ගොඩනැගිලි හා බස්රථ නැවතුම්පල පිරිසිදු කිරිම
15. බස්රථ නැවතුම්පලවල පිහිටි වැසිකිළි පද්ධති මුදල් අයකර පවත්වාගෙන යාම සඳහා කොන්ත්‍රාත් සේවා
16. ආරක්ෂක සේවා (කාර්යාල / බස්රථ නැවතුම්පල)
17. විදුලි සෝපාන අළුත්වැඩියාව හා සේවාව
18 ගලිබවුසර් සේවා සැපයිම (කොළඹ,ගම්පහ,කළුතර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි)
19. ගිනි නිවිමේ උපකරණ සේවා කිරිම.
20. ශ්‍රවනාගාර සන්නිවේදන පද්ධති සේවා
21. ඇමතුම් උපකරණ / ඇම්ප්ලිපයර් (Ampilifire) / ස්පීකර් අළුත්වැඩියා හා සේවා
22. CCTVකැමරා / ඩිජිටල් කැමරා හා මල්ටිමිඩියා උපකරණ අළුත්වැඩියා හා සේවා
23. බස්රථ කාලසටහන් යන්ත්‍ර අළුත්වැඩියා හා සේවා
24. ඇගිලි සළකුණු යන්ත්‍ර අළුත්වැඩියා හා සේවා
25. කුලී රථ සේවා
26. මිණුම්දෝරු සේවා
27. දේපළ පිරියත හා උපකරණ තක්සේරු සේවා
28. ආහාර වර්ග සැපයීම (පුහුණු වැඩසටහන් සඳහා තේ, දිවා ආහාරය සහ සවස තේ )
29. උත්සව භාණ්ඩ සැපයීම
30. විදේශ අධයන චාරිකා සංවිධානය කිරීම
31. ඩිජිටල් නාම පුවරු සැලසුම් කිරීම හා සකස් කර ස්ථාපිත කිරීම
32. වැඩසටහන් කළමනාකරණය
33. පරිගණක ජාල වැඩසටහන් , පරිගණක පද්ධති සැකසීම
34. සූර්ය විදුලි බල පද්ධති සේවා කිරීම
35. බැහැරගත පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සම්බන්ධ සේවා (OBT)

## උපදේශන සේවා ලබා ගැනීම

01. ගොඩනැගිලි ඉදිකිරිමට අදාල ඉංජිනේරුමය සැලසුම් සකස් කිරිම
02. පරිගණක වැඩසටහන් සැලසුම් සකස් කිරීම.
03. සංයුක්ත සැලස

## ලියාපදිංචි කිරිමේ කොන්දේසි -

01. අයදුම්පත්‍රය හා කොන්දේසි ඇතුලත් විස්තර පත්‍රිකා202 /........./........දින දක්වා අයදුම්පත්‍ර ගාස්තු ලෙසරු.250/- ක මුදලක් පහත ලිපිනයේ අයකැමි වෙත මුදලින් ගෙවීම් කර ලබා ගත හැකිය. තවද එම මුදල් අධිකාරියේ www.rpta.wp.gov.lkවෙබ් අඩවිය වෙතින් භාගත කිරීම් කර රු.250/- ක මුදලක් මෙම අධිකාරියේ 208100123617714 අංක දරණ මහජන බැංකු , **බැංකු ගිණුම වෙත ගෙවීම් කර එම ගෙවීම් කළ රිසිට්පත අයදුම්පත්‍ර සමග අමුණා එවීම සිදු කළ හැක.**

02. එක් අයදුම්පත්‍රයකින් ලියාපදිංචි විය හැක්කේ එක් අයිතමයක්වෙනුවෙන් පමණි.

03. <u>භාණ්ඩ</u> හෝ <u>සේවා</u> කටයුතු වලට අදාල එක් අයිතමයක් ලියා පදිංචිය වෙනුවෙන් අයකෙරෙන ගාස්තුව රු.1000/- ක් වන අතර <u>ඉදිකිරිම්</u> විෂයට අදාල වැඩ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා එක් අයිතමයක් වෙනුවෙන් ලියාපදිංචි ගාස්තුව රු.2000/- ක් වේ.

04. ලියාපදිංචිය සඳහා ගෙවීම් "සභාපති මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය - බස්නාහිර පළාත" නමට චෙක්පත් මගින් හෝ අධිකාරිය වෙත පැමිණ මුදලින් ගෙවීම් කර හෝ කොන්දේසි අංක 01 යටතේ දක්වා ඇති බැංකු ගිණුම වෙත ගෙවීම් කර එම රිසිට්පත අයදුම්පත්‍රය සමග අමුණා, අයදුම්පත්2020/12/........ ප.ව.03.00ට පෙර සභාපති මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (බප) අංක 89, "රන්මගපාය", (බිම්මහල) කඩුවෙල පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ පැමිණ භාරදිය හැකිය.

05. චෙක්පත් මුදල් වීමෙන් පසුව පමණක් අයදුම්පත්‍රය වලංගුභාවයට පත්වේ.**බැංකු ගිණුම් වෙත සිදු කරනු ලබන ගෙවීම් වල ගෙවීම් සිදු කළ රිසිට්පත අමුණා එවා නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.** මුදල් ඇණවුම් සහ තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත් නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (සියළුම ගෙවීම් අයකැමි වෙත පමණක් කළ යුතුයි).

06. සෑම අයදුම්පතක් සමග ව්‍යාපාරය ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක්,එකතු කළ අගය මත බද්ද(VAT) සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක්සහ පසුගිය වර්ෂවල සේවා හා සැපයීම් කරන ලද ගනුදෙනු කරුවන්ගේ විස්තර ඇත්නම් එම ලේඛණයක්ද සහිතව අයදුම්පත්‍රය ඉදිරිපත් කල යුතුයි. "ඉක්ටැඩ්" සහිත ඉදිකිරිම් වැඩ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා වලංගු "ඉක්ටැඩ්" ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුයි. (2020/2021) වසරට වලංගු "ඉක්ටැඩ්" සහතිකය) එවනු ලබන අයදුම්පත් පිළිබඳ අවසාන තීරණය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

- <u>"සේවා"</u> අයිතම අංක 12 සහ <u>උපදේශන සේවා ලබා ගැනීම</u> යටතේ අංක 01 ට අදාල ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ වරලත් ඉංජිනේරුවන්ගේ හා වරලත් ගෘහ නිර්මාණ ශිල්පින්ගෙන් හෝ ඒ හා සමාන සුදුසුකම් ලත් අයගෙන් පමණි. (අදාල සුදුසුකම් සනාථ කිරිමට අවශ්‍ය ලියවිලි ඡායාපිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.)

07. සාමාන්‍යයෙන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් නාම ලේඛණය තුලින් සැපයීම් / සේවාවන් සහ කොන්ත්‍රාත් වැඩ සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ. එහෙත් ප්‍රමාණවත් සැපයුම්කරුවන් හෝ වැඩ කොන්ත්‍රාත්කරුවන්ගේ සංඛ්‍යාවක් නොමැති විට හෝ වෙනත් ඕනෑම අවස්ථාවකදී වෙනත් ප්‍රසිද්ධ ආයතන වෙතින් හෝ ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන නාමාවලිය මාර්ගයෙන්මිළ ගණන් කැඳවා මිලදී ගැනිම හෝ සේවා ලබා ගැනිමේ අයිතිය මෙම අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුය.

08. ලියාපදිංචි කරනු ලැබූ යම් අයදුම්කරුවකුගේ සේවාව හෝ මිළ ගණන් කැදවීමේදී දක්වන ප්‍රතිචාරය සතුටුදායක හෝ යහපත් නොවන විට ඒ සඳහා හේතු නොදක්වා වුවද ලියාපදිංචි ලේඛණයෙන් ඉවත් කිරිමේ හෝ මිළ ගණන් කැදවීම අත්හිටුවීමේ බලය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

09. <u>"ඉදිකිරීම (01)"</u> යටතේ කොන්ත්‍රාත් පැවරීම් ඉක්ටැඩ් ශ්‍රේණියට අදාල ඒ ඒ කොන්ත්‍රාත් වටිනාකම් සීමාවන් යටතේ පමණක් සිදු කරනු ලැබේ.

10. සැපයීම් යටතේ ලියාපදිංචි වන ගැණුම්කරුවකු වසර පුරාම අදාල මිල ගණන් යටතේ සැපයීම් සිදු කිරිමට එකඟ විය යුතුය. රජයේ බදු, නීතිරිති අනුව 10% සීමාවන් දක්වා පමණක් අදාල වැඩිවීම් භාරගැනිමට ප්‍රසම්පාදන කමිටුවට අනුමැතිය ලබාදිය හැක.

11. කිසියම් සැපයුම්කරුවකුගේ සේවාව පිළිබඳ අධිකාරිය සෑහීමකට පත්විය යුතුය. යම් හෙයකින් අදාල සැපයීම්, ඉදිකිරීම හෝ සේවා සතුටුදායක නොවන අවස්ථාවකදී එම සැපයුම්කරු අසාධුගත (Blacklist) කරන අතර, වසර 05 ක් යනතුරු නැවත ලියාපදිංචිය භාරගනු නොලැබේ.

**<u>සැලකිය යුතුයි.</u>**

01. අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරනු ලබන සියළුම ඡායාපිටපත් සත්‍ය පිටපතක් (TRUE COPY) බව සඳහන් කර ව්‍යාපාරය අයිතිකරුගේ අත්සන හා නිල මුද්‍රාව තබා ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ. (අවශ්‍ය විටදී මුල්පිටපත පරික්ෂා කිරිමට ඉදිරිපත් කල යුතුය.)

02. ලියාපදිංචි ගාස්තු මුදලින් ගෙවීම් කිරිමේදි එම ලදුපත්වල ඡායා පිටපතක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කල යුතුයි.

03. බස්නාහිර පළාත තුළ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ආයතන සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. වැඩි විස්තර සඳහා 011 – 2871355 දුරකථන අංකයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුලා) හෝ 071 – 4460560අංකයෙන් ප්‍රසම්පාදන කමිටු ලේකම් ගයාන් දොලවත්තමහතා අමතන්න.

ඕ.ඩබ්. ප්‍රසන්න සංජීව
සභාපති
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය(බප)
අංක89."රන්මගපාය",කඩුවෙල පාර.
බත්තරමුල්ල.
2020.12.07